මනෝ විද්‍යාව

# විශ්වාස මත පදනම් වූ සුවවීම්

කෑම වර්ග, දන්තාලේප, සබන් හා ඖෂධ වර්ග යනාදි මිනිස් පරිභෝජනයට ගන්නා නොයෙකුත් දේ, ප්‍රසිද්ධ පුද්ගලයින් හා රූමත් කාන්තාවන් යොදාගෙන වර්ණවත් පිංතූර සිත් කා වදින වදන් ආදිය යොදා ගනිමින් ජනමාධ්‍ය හරහා තම නිෂ්පාදන ගැන වෙළෙන්දෝ අතිශයෝක්තියෙන් කථා කරති.

විශේෂඥ මනෝවෛද්‍ය
**සරත් පඬුවාවල**



යම්කිසි සිදුවීමකට හේතුවක් නොදන්නේ නම් එය යම් යම් විශේෂිත බලවේගයන්හි බලපෑමෙන් ඇතිවන්නක් බව විශ්වාස කිරීම මිනිස් ගතිය වේ. අනාදිමත් කාලයක සිට මෙය සිදු වී ඇත. දැනුදු අප රටේ පමණක් නොව ලොව සෑම තැන ම මෙවැනි විශ්වාස දරන්නන් සුලබ ය. ශාරීරික හා මානසික රෝගාබාධ වැළඳීම සම්බන්ධයෙන් වූ මෙවැනි විශ්වාස වර්තමානයේ පවා නිතර දක්නට ලැබෙන අතර රෝග සුව කිරීම පිණිස මෙවැනි විශ්වාස මුල් කොටගත්තා ක්‍රම සුලබව භාවිතා වේ.

'දෙවියන්ගේ හා යකුන් ප්‍රේතයින්ගේ බලපෑම්, හූනියම් හා කොඩිවිනවල බලපෑම් ග්‍රහ අපල ආදිය නිසා වැළඳෙනැයි සිතන රෝගාබාධවලට දෙවියන්ට භාරවීම්, යකුන්, ප්‍රේතයින් එළවීම සඳහා බලිතොවිල් කිරීම, ශාන්තිකර්ම, කොඩිවින කැපීම හා යන්තර බැඳීම ආදිය සිදු කෙරෙයි. රෝගාබාධවලින් මිදීමේ චේතනාවෙන් මෙකල බෝධිපූජාවන් ද කෙරේ. මීට අමතරව වර්තමානයේ දෙවියන්ට යාඥා කිරීම, යේසු ජීවමාන වේවා, දේවපාමුල නම් දේව මෙහෙය ආදිය සමහර ක්‍රිස්තියානි පූජකයින් යයි කියා ගන්නා පිරිසක් විසින් රෝග සුව කිරීම සඳහා රට පුරා පවත්වා ගෙන යනු ලැබේ.

බොහෝමයක් ප්‍රතිකර්ම වලට මූලික වන්නේ යෝජනා කිරීම් හැඟවීම් හෙවත් ව්‍යංගය (suggestion) නම් වූ තත්ත්වය යි. මෙය ප්‍රතිකාරයේදී පමණක් නොව එක් පුද්ගලයෙක් තවකෙකුට බලපෑම් කිරීමේදී මෙම යෝජනා කිරීම් හා හැඟීම් ඇතිකරලීම ප්‍රධාන තැනක් ගනී. මෙය වෙළඳ දැන්වීම් හා අනෙකුත් ප්‍රචාරක කටයුතුවලදී ආගමික හා දේශපාලන කටයුතුවලදී ද විශාල වශයෙන් භාවිත වේ. මෙය සෑම මනෝ ප්‍රතිකාර ක්‍රියාවලියකදීම වැදගත් වන අතර වෛද්‍යවරයෙකු හා රෝගියෙක් අතර ඇති සාර්ථක සබඳතාවට ද හේතු වේ.

වෛද්‍යවරයකුගේ සාර්ථකත්වයට ඔහුගේ පෙනුම, කථාබහ, හැසිරීම් රටාව, රෝගියාගේ තත්ත්වය ගැන දක්වන උනන්දුව ආදි කරුණු බලපායි. බෙහෙත් පෙති, කරල්, පැණි හෝ වෙනයම් ආකාරයක ප්‍රතිකර්ම ආදි ඕනෑම ප්‍රතිකාරයක යම් ආකාරයක හැඟීම් ඇති කිරීමක් සිදු වේ. ඖෂධයක ක්‍රියාකාරී සංඝටකයක් අන්තර්ගත වීමට වඩා එහි වර්ණය, රසය, එය ඇසුරුම් කර ඇති අයුරු ආදිය ඉතා විශාල බලපෑමක් ඇති කරවයි.

මෙහිදී ඇත්ත වශයෙන් ම වන්නේ පිළිගැනීමක් සඳහා අවශ්‍ය තර්කානුකූල පදනමක් රහිතව සන්නිවේදිත කියමන හෝ යෝජනාව බලවත් ලෙස ඇදහීමක් හෝ පිළිගැනීමකි. එනම් යමෙක් නියම තර්කානුකූල පදනමක් රහිතව අනෙකකුගේ මනසට ඉතාමත් ක්‍රියාකාරී ලෙස බලපෑම් ඇති කිරීමයි. අප රටේ නොයෙකුත් ජනමාධ්‍යයන් මගින් එනම් රූපවාහිනියෙන් හා නොයෙකුත් පුවත්පත් හා සඟරා ආදියෙන් වෙළඳ ද්‍රව්‍ය ඖෂධ ඇතුළු අනෙකුත් ප්‍රතිකාර ක්‍රම ගැන කරන ප්‍රචාරයන් බොහෝ විට මෙවැනි අන්දමේ ඒවාය. උදාහරණ වශයෙන් කෑම වර්ග, දන්තාලේප, සබන් හා ඖෂධ වර්ග යනාදි මිනිස් පරිභෝජනයට ගන්නා නොයෙකුත් දේ, ප්‍රසිද්ධ පුද්ගලයින් හා රූමත් කාන්තාවන් යොදාගෙන වර්ණවත් පිංතූර සිත් කා වදින වදන් ආදිය යොදා ගනිමින් ජනමාධ්‍ය හරහා තම නිෂ්පාදන ගැන වෙළෙන්දෝ අතිශයෝක්තියෙන් කථා කරති.

කිසිම සෙවිල්ලකින් බැලිල්ලකින් තොරව මේවාට මුලා වන ජනතාව මෙම නිෂ්පාදන මිලදී ගනිති. රෝග නිට්ටාවට සුව කරන බව සඳහන් කරන බෙහෙත් හා ප්‍රතිකාර ක්‍රම යොදා ගන්නා රෝගීහු නිකරුනේ කරදරයට පත් වෙති. මෝහනය නොහොත් ස්වාපන ප්‍රතිකාරය කෝකටත් තෛලයක් සේ මාධ්‍ය මගින් ප්‍රචාරය කර හැර තිබෙන අතර මේ නිසා බොහෝ මානසික රෝගීහු හා ඔවුන්ගේ ඥතීහු මෙවැනි ප්‍රතිකාර ලබා ගැනීමට උත්සුක වන අතර මෙවැත්තන්ගෙන් බහුතරයක් කිසිදු ප්‍රතිඵලයක් නොලබති. සමහරු උග්‍ර ලෙස රෝගී වෙති.

කලින් සඳහන් කළ පරිදි හැඟීම් ඇති කරලීම සැම සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක ම සිදු වේ. එසේම අත්දැකීම් ඇති වෛද්‍යවරයකුගේ කරුණාවන්ත බව, ප්‍රසන්න හෙදියකගේ සිනාව, රෝහල් ප්‍රතිනාශකාදියේ නිසා ඇතිවන ප්‍රසන්න ගන්ධය ඖෂධයන් හි වර්ණය රසය යනාදිය රෝගියා සුවකරලීම පහසු කරවන හැඟීම් ජනිත කරවයි. සම්බාහනය, රශ්මි ප්‍රතිකාර, හිරුකිරණ ප්‍රතිකාර, ශරීරයේ මඩ තවරා නෑම, බෙහෙත් ඔරුවේ ලෑම ආදි ප්‍රතිකාරයන් සාර්ථක බවක් ලබා ඇත්තේ ඉන් මනසේ ජනිත කරවන තදබල හැඟීම් නිසා ය. වෛද්‍යවරයා කෙතරම් හොඳින් ප්‍රතිකාර කරන්නේද යත් ඔහු දෙන ඇල්වතුර ටික පවා රෝග සුව වීමට ප්‍රමාණවත් බව සමහරු කියනවා අසන්නට ලැබේ. රෝගියාගේ මනසෙහි එවැනි හැඟීමක් ජනිත කරලීමට වෛද්‍යවරයාගේ පෞරුෂය කෙතරම් බලපාන්නේදැයි ඉන් පැහැදිලි වේ.

දේව, යක්ෂ, ප්‍රේත ආදී සියළු අමානුශික බලවේග මිනිස් මනස මුල් කොටගත් සංකල්පයන් ය. ලෝකය දෙවියන් විසින් මවනු ලැබ ඇති බව සමහර අය විශ්වාස කළ ද ඇත්තෙන් ම යථාර්ථය වන්නේ මේ පිළිබඳ නියම අවබෝධයෙන් තොර වූ පැරණි මිනිසා විසින් දෙවියන් මවනු ලැබ ඇති බවයි. ආදිකාලීන මිනිසාගේ සිත්හි ජනිත වූ මෙවැනි දේ කාලයාගේ ඇවෑමෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ තදබල විශ්වාස බවට පත්වී තිබේ. මිනිස් යටි සිතේ තැන්පත් වී ඇති මෙවැනි සිතුවිලි, තමන් කිසියම් දෙයක් ගැන අනවබෝධයෙන් සිටින අවස්ථාවලදී "මේක මොකක් හෝ බලවේගයකින් (දේව, යක්ෂ, ප්‍රේත) සිදුවන දෙයක්" යනුවෙන් විශ්වාස කිරීමට පෙළඹේ. ලොව නොයෙකුත් ජන කණ්ඩායම් අතර මේ පිළිබඳ නොයෙකුත් විශ්වාස පවතින අතර අප රටේ මිනිසුන්ගේ විශ්වාසවලට ඉන්දියානු මිත්‍යා විශ්වාසවල බලපෑම අතිමහත් ය. හින්දු සංස්කෘතියට සම්බන්ධ මුරුගා (කතරගම) විෂ්ණු, කාලිඅම්මා, ලක්ෂ්මී ඇදහීම් හා වන්දනාවන් අද මෙරට ඉතා ප්‍රචලිත ය. මීට අමතරව සමහර කණ්ඩායම් සායිබාබා වන්දනාවේ යති.

ඇත්තෙන් ම මේ ආකාරයේ ඇදහිලි හා වන්දනාවන්ට මූලිකත්වය ගෙන කටයුතු කරන බොහෝ පුද්ගලයින් කරන්නේ මිනිස් සිතෙහි මේ පිළිබඳ භක්තියක් උපදවා එමගින් මුදල් උපයා ගැනීම යි. මෑත කාලයේ සමහර වෙළඳුන් යම් යම් භෞතික වස්තූන් නිවසේ තැන්පත් කිරීමෙන් යස ඉසුරු පහළවන බවට යෝජනා කරමින් මුදල් ඉපයීමට උත්සාහ කරති. මේ සැම අවස්ථාවකදීම දක්නට ලැබෙන්නේ යම් පුද්ගලයෙක් හෝ කිහිප දෙනෙක් හෝ කණ්ඩායමක් විසින් කිසියම් කියමනක් නැවත නැවත ප්‍රකාශ කරමින් එමගින් අහවල් දේ සිදුවෙතැයි කීමත්, එය අන් අය විසින් කිසිම වග විභාගයකින් තොරව පිළිගැනීමත් ය. ඇත්තෙන් ම එය සමහරු කියන්නාක් මෙන් බොරුවක් නිතර නිතර කීමෙන් ඇත්තක් බවට පත්වන බවයි.

> ආගම් තිබෙන්නේ රෝගවලට ප්‍රතිකාර කිරීමට නොව මිනිසුන්ගේ අධ්‍යාත්මික පැත්ත වැඩිදියුණු කිරීම ය. එමගින් මනස යහපත්ව පැවතීම හේතුවෙන් රෝග වැළඳීමේ ඉඩකඩ අඩුවනු ඇත. කෙසේ වුවත් විශ්වාස මුල්කොට ගෙන රෝග සුවකිරීම පුරාණ කාලයේ පටන් සිදු වේ.

මුලින්ම මෙහි සඳහන් කළ පරිදි හැඟවීම හෙවත් ව්‍යංගය(Suggstion) මේ සැම දෙයකම මූලික කරුණ යි.

දෙවියන් යකුන් පෙරේතයින් සම්බන්ධ ප්‍රතිකර්ම බොහෝවිට ඖෂධ භාවිතයෙන් සුව නොවන නොයෙකුත් ශාරීරික රෝග ලක්ෂණ වාත අමාරු, ඇදුම ආදිය සම්බන්ධ වේ. තවද මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවීම අන්ධයින්ට පෙනීම ලබාදීම, බිහිරන්ට ඇසීමට සැලැස්වීම, කොරුන් ඇවිද්දවීම ආදිය ද කරනවායයි කියති.

ඖෂධවලට සුව නොවන ශාරීරික රෝග ලක්ෂණ (වෙනත් රෝග නැති බවට පරීක්ෂණ මාර්ගයෙන් සනාථ කර ඇතිවිට) බොහෝ විට ඇතිවන්නේ මානසික පීඩන හා අසහනවල ප්‍රතිඵලයක් වශයෙනි. වැඩිහිටියන්ට වැළදෙන ඇදුම (වීස් එක) වැනි රෝග ද බොහෝවිට හට ගන්නේ මෙවැනි තත්ත්ව යටතේ දී ය. මත්පැන් දුම්වැටි මත්ද්‍රව්‍ය භාවිතයට ද මනස සම්බන්ධ ය. එනිසා නොයෙකුත් අමානුශික බලවේගවලට මනස යොමුකිරීමට යෝජනා කිරීම් එම යෝජනා ඉතසිතින් පිළිගැනීම මගින් යම් සහනයක් වන්නට පුළුවන. ස්වයං ව්‍යංගාත්මක තත්ත්ව යටතේ පුද්ගලයන්ගේ යම් යම් රෝග ලක්ෂණ එනම් කථාවේ දෝෂ පෙනීමේ දෝෂ, ඇවිදීමේ දෝෂ ආදිය හටගැනීමට පුළුවන. පසුගිය කාලයේ 'හිස්ටීරියා' යන වචනය භාවිතා වූයේ මෙවැනි තත්ත්වයන්ට ය. මෙවැනි තත්ත්වයන්හිදී කලින් සඳහන් කළ යෝජනා හා හැඟවීම් මගින් පිළියම් කළ හැකි ය. ආගමේ මුවාවෙන් ප්‍රතිකාර කරන සමහරු යම් යම් පුද්ගලයින් ;කාරුන්, අන්ධයන් සේ වෙස්ගන්වා ඔවුන්ගේ ප්‍රතිකාරවලින් සුව වන බව ප්‍රදර්ශනය කර මිනිසුන් මුලා කරන අවස්ථා ද දක්නට ලැබේ.

ආගම් තිබෙන්නේ රෝගවලට ප්‍රතිකාර කිරීමට නොව මිනිසුන්ගේ අධ්‍යාත්මික පැත්ත වැඩිදියුණු කිරීම ය. එමගින් මනස යහපත්ව පැවතීම හේතුවෙන් රෝග වැළඳීමේ ඉඩකඩ අඩුවනු ඇත. කෙසේ වුවත් විශ්වාස මුල්කොට ගෙන රෝග සුවකිරීම පුරාණ කාලයේ පටන් සිදු වේ. නැවතත් සඳහන් කරතොත් මෙහිදී ඇත්තෙන් ම වන්නේ යමෙකු ගේ මනස යම් ඇදහීමකට ආරෝපනය කර ඉන් ඇතිවන විශ්වාසය මගින් සහයනයක් ලැබීම යි.

කොහොම හරි ගුණයක් ලැබෙනවා නම් යමක් කිරීමේ වරදක් නැතැයි තාවකාලික සුවයක් ලදුවත්, දිගුකාලීන ප්‍රතිඵල අනර්ථකාරී විය හැකි ය. එක් පුද්ගලයෙක් මෙවන් මිත්‍යා විශ්වාස මගින් මෙහෙයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කණ්ඩායම් පිටින් දිවිනසා ගැනීමේ සිද්ධීන් මීට උදාහරණ ලෙස සඳහන් කළ හැක.

අවසාන වශයෙන් මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ බුදුන් විසින් දේශනා කරන ලද අංගුත්තර නිකායේ සඳහන් කාලාම සූත්‍රය යි. ඉන් මෙසේ පවසා තිබේ.

ඔබ ඇසූ පමණින් යමක් විශ්වාස කරන්න එපා. පරම්පරාවෙන් පැවත ආ පමණින් ම පිළිගන්න එපා. බොහෝ දෙනෙක් කථා කළ පමණින් හෝ කී පමණින් එය පිළිගන්න එපා. ඔබගේ ආගමික පොත්වල සඳහන් වූ පමණින් ද යමක් පිළිගන්න එපා. වැඩිහිටියන් හා ගුරුවරුන් කී පමණින්ම සැම දෙයක් ම පිළිගන්නට එපා. නමුත් යමක් නිරීක්ෂණය හෙවත් අවලෝකනයෙන් නැත්නම් හොඳින් සොයා බැලීමෙන් පසු විශ්ලේෂණයෙන් හා විග්‍රහ කිරීමෙන් අනතුරුව හේතුවත් සමග ගැලපේ නම් ද සැම කෙනෙකුගේ ම හොඳට හා යහපතට දයක වේ නම් ද එය පිළිගත මැනවි.

❑